# බෞද්ධාලෝකය

ඊ පුවත්පත

සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය

ශ්‍රී බුද්ධ වර්ෂ 2565
ඇසල මස 23 වන සිකුරාදා දින



2021 ජනවාරි මාසයේ පැවැත්වීමට නියමිතව තිබු සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයට ඉදිරි වර්ෂ තුන සඳහා කෘත්‍යාධිකාරී මණ්ඩලයේ නිලධාරින් පත්කර ගැනීමේ නිලවරණය කෝවිඩ් වසංගතය හේතුවෙන් කල් දැමීම නිසා 2021 අප්‍රේල් 3 දින පවත්වන ලද අතර වාර්ෂික මහා සභාව අප්‍රේල් 04 ඉරුදින පවත්වන ලදී. ඉදිරි වර්ෂ තුන සඳහා වැඩි ඡන්දයෙන් තේරී පත්වූ කෘත්‍යාධිකාරී මණ්ඩලය මෙසේය.


බෞද්ධාලෝකය



**සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය**

අංක 380. බෞද්ධාලෝක මාවත. කොළඹ 7.
දුරකථනය ( 0112691695 / 011 2688517 / 011 2667017)
ෆැක්ස් ( 011 2688517)
web : www.acbc.lk
E-mail : acbc380@gmail.com



බෞද්ධාලෝකය




නව නිලධාරී මණ්ඩලය

ගරු සභාපති - චන්ද්‍ර නිමල්වාකිෂ්ඨ මහතා

හිටපු ගරු සභාපති- ජගත් සුමතිපාල මහතා

ගරු නියෝජ්‍යසභාපති- මද්දුමගේ රොෂාන් සම්පත් පෙරේරා මහතා

ගරු සමලේකම්වරු
- තුෂාර දිලුම්වාහලතන්ත්‍රී මහතා
- ඉෂාන් බුද්ධික එදිරිසූරිය මහතා

ගරු භාණ්ඩාගාරික
- ජෙනරාල් ආර්.එම්.ඩී.රත්නායක මහතා

ගරු උපසභාපතිවරු
- වෛද්‍ය රාණී ප්‍රනාන්දුමහත්මිය
- වසන්ත ද සිල්වා මහතා
- රියර් අද්මිරාල් ආනන්ද පීරිස් මහතා
- නිලීකා සේනානායක මහත්මිය
- ආනන්ද ලක්ෂ්මන් කෝට්ටගේ මහතා
- විද්‍යාජෝති මහාචාර්ය නිමල් ද සිල්වාමහතා
- උපුල් රූපසිංහ මහතා
- මහාචාර්ය සුසිරිපාල මාලිම්බඩ මහතා
- ලලීන්ද්‍ර රණවීර මහතා
- ආචාර්ය එල්.එම්.කේ.තිලකරත්න මහතා

ගරු උපලේකම්වරු
- එඩ්මන්ඩ් වික්‍රවමසිංහ  මහතා
- එච්. රවි   පීරිස් මහතා

සංස්කාරක මණ්ඩලය
- මහාචාර්ය ප්‍රණීත් අභයසුන්දර
- වෛද්‍ය රාණී ප්‍රනාන්දු
- ඉෂාන් බුද්ධික එදිරිසූරිය
- ආචාර්ය අශෝක කරුණාරත්න
- නාලක ජයසේන
- ශ්‍යාම් නුවන් ගනේවත්ත

පිටු සැකසුම
- කවිදු රන්දිමාල් ද අල්විස්


# බෞද්ධාලෝකය



තේරී පත්වූ උප සභාපති ආචාර්ය සෙනරත් දිසානායක මහතා ඉල්ලා අස්වීමෙන් ඇතිවූ පුරප්පාඩුවට විශ්‍රාමලත් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ලලීන්ද්‍ර රණවීර මහතා ව්‍යවස්ථානුකූලව පත්කරන ලදී. අප්‍රේල් 03 නිලවරණයෙන් තේරී පත්වූ නව නිලධාරී මණ්ඩලය - වාර්ෂික මහා සභාව නිමවූ විගස බම්බල පිරියේ සිරිවජිරාරාමයට ගොස් අති පූජ්‍ය තිරිකුණාමලේ ආනන්ද හිමියන් බැහැ දැක අනුශාසනා පරිදි තෙරුවන් වැඳ පුදා ගති. එම මස 09 වෙනි සිකුරාදා දින ගෞරවනීය සංඝරත්නය සම්මේලන මූලස්ථානයට වැඩම කරවා සිදු කරන ලද දානමය පුණ්‍ය කර්මය ප්‍රථම නිල රාජකාරිය විය. ඉන් පසු කෘත්‍යාධිකාරී මණ්ඩල සාමාජික සාමාජිකාවන් අප්‍රේල් 17 දින මහනුවර බලා පිටත් වී අති පූජනීය දළදා වහන්සේ වැඳ පුදාගති. පිරිස ඉතා ආදරයෙන් පිළිගත් දියවඩන නිලමේ නිලංග දෑල මැතිතුමා උදය භෝජන සංග්‍රහය පිරිනැමීමට කාරුණික විය. ඉන් අනතුරුව පිරිස මල්වතු අස්ගිරි මහනාහිමිවරුන් හා අනුනාහිමිවරුන් බැහැ දුටුවෝය. පිරිස ඉතාම කරුනා වෙන් හා මෛත්‍රියෙන් පිළිගත් මහානාහිමිවරුන් රටේ අනාගත මෙන්ම බුද්ධශාසනයේ චිරස්ථිතිය වෙනුවෙන් බෞද්ධ මහා සම්මේලනයේ කාර්යභාරය පැහැදිලි කර, ඒ සඳහා කලයුතු වැඩ පිළිවෙල දීර්ඝ ලෙෂ සාකච්ඡා කර ඒ සඳහා නව නිලධාරි මණ්ඩලයට අවශ්‍ය ශක්තිය හා ධෛර්යය ප්‍රාර්ථනා කර, පිරිත් නූල් බැඳ සෙත් පැතූහ.




බොදු හිමිකම් කොමිසමේ වාර්තව
කොමිසමේ ලෙකම් චන්ද්‍ර නිමල් වාකිශ්ට මෙතිතුම විසින් ගරු
අගමැති මහින්ද රජපක්ශ මැතිතුමා වෙත පිලිගැන්වීම



# සද්ධාවන්ත කුල පුත්‍රයින් දැකිය යුතු ස්ථාන සතරකි.

ඒ. ඉනෝකා ප්‍රියංගනී පෙරේරා
ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය (දෙවන වසර)
සමාජ හා මානව විද්‍යා අංශය

**බුදුරජාණන්වහන්සේ කුසිනානුවරමල්ල රජදරුවන්ගේ උපවර්තන සල් උයනට වැඩ පිරිණිවීමට සුළු මොහොතකට පෙර දේශනා කල මහා සුදර්ශන සූත්‍රය හා පරිනිබ්බාන සූත්‍රය ගැන අසා ඇත. මහා පරිනිබ්බාන සූත්‍රයේදී සද්ධාවන්ත කුල පුත්‍රයකු විසින් දැකිය යුතු ස්ථාන හතරක් ගැන දේශනාකර ඇත. එම ස්ථාන නම්,**

01. සිදුහත් කුමරු උපන් ස්ථානය
02. බෝසතාණන් වහන්සේ බුදුවූ ස්ථානය
03. බුදුරජාණන් වහන්සේ ධම්සක් සූත්‍රය දෙසූ ස්ථානය
04. බුදුරජාණන්වහන්සේ පිරිණිවූ ස්ථානය



## සිදුහත් කුමරු උපන් ස්ථානය (ලුම්බිණිය)

සිදුහත් කුමරුගේ උත්පත්තිය සිදුවූයේ මෙහිදීය. කිඹුල්වත් නුවරටත් දෙව්දහනගරයටත් අතර මැද ලුම්බිණි සාල වනය පිහිටා ඇත. ලුම්බිණි නම් රාජ කුමාරිකාවකගේ නමින් මෙම උයන නම්කර ඇත. මේඅසල පිහිටි ගමද ලුම්බිණි නමින් හැඳින්වෙයි.

බුද්ධ පරිනිර්වාණයෙන් අවුරුදු දෙසීය තිස්හතකට පසු අශෝක අධිරාජයා මෙහි පැමිණ බුදුරජුන් උපන් ස්ථානය දැකබලාගෙන ගල් කණුවක් කරවා තමාගේ පැමිණීම සනිටුහන් කර ඇත. වර්තමානයේ මෙම ස්ථානය භාවිතාකරන්නේ "රුමින්දෙයි"නාමයෙනි.





## බෝසතුන් බුදුවූ ස්ථානය (ගයාශීර්ෂය)

බෝසතුන් බුද්ධත්වයට පත්වූ ස්ථානයයි. දුෂ්කරක්‍රියා අතහැරදැමූ බෝසතුන් සුජාතාවගේ කිරිපිඬුදානය පිළිගෙන එය වළදා සොත්ථිය බමුණාදුන් කුස තණ අටමිට රැගෙන ගයාශීර්ෂයේ බෝමැඩවෙත පැමිණ එහි චතුරංග වීර්යය වඩාහින්ද ගත්හ. එදා රාත්‍රියේ පැමිණි දස මරුන් පරදවා බුද්ධත්වයට පත්වූබව සුත්ත නිපාතයේ ප්‍රධානතම සූත්‍රයේ සඳහන් කෙරේ.
ඒ ජය ශ්‍රීමහා බෝධි මූලයේදීය.

ගයාශීර්ෂයේ ජය ශ්‍රීමහා බෝධීන්වහන්සේට තරමක් දුරින් ගම සේනානියංගම වන අතර ඒ ගම නේරංජනා නදිය අසළපි හිටියේය. ගයාරාජර්ෂීන් විසින් කරන ලද බැවින් එය ගයානම් විය. මේ ගම සමීපයෙහි පිහිටි තොටුපළ ගයා තිත්ථ නම්වේ.

## බුදුරජුන් දම්සක් සූත්‍රය දෙසූ ස්ථානය (බරණැස ඉසිපතනාරාමය)



බෝසතුන් බුද්ධත්වයට පත්වීමෙන් පසු ප්‍රථම ධර්මදේශනය පිණිෂ බරණැස ඉසිපතනාරාමයට වැඩියහ.

ඒ දුෂ්කර ක්‍රියා සමයෙහි තමා සමඟ එකට සිටිපස් වග මහණුන් හට දහම් අවබෝධකර වීම පිණිසය.
වර්තමාන යේ හඳුන්වනු ලබන බරණැස සාරානාත් යනු ඉසිපතනයයි. බුද්ධකාලයේදී මෙය මුවන් ගැවසී ගත් මුව වනයකි.
පුරාණ කාලයේ කාශීජනපදයේ අගනුවර බරණැස වීය මෙම නගරය බරණාසී, බෙනාරිස්, බරණැස, කශීයන නම්වලින් හඳුන්වා ඇත.
මෙය නිස්කලංක සුවදායක පරිසරයකින් යුතු පිංබිමක්විය. මේහරහා ගමන් ගත් සෘෂිවරු සිත්සුව පිණිෂ මෙහි නැවතී සමාධි සුව වින්දාහ.
හිමාල පර්වතය ආශ්‍රිතව සෘෂිවරු න් විශාල පිරිසක් ජීවත්වූ අතර ඔවුන් දාර්ශනික සංවාද පිණිෂ මෙම ස්ථානයට පැමිණේ.
අහසින් පැමිණි සෘෂිවරුන් පතනය වූ භූමිය ඉසිපතනාට්‍ය නම්විය.

එදා ඇසළ පුන්පොහෝදා දම්සක් පැවැත්වූයේ මෙම පස්වග මහනුන්ටය. බුදුරජුන්ගේ ප්‍රථම ධර්මදේශනය ධම්ම චක්කප්පවත්තන සූත්‍රය බරණැස ඉසිපතනාරාමයෙහි මිගදායි නම් මුව වනයේ පවත්වන ලදැයි භූමා ටුදෙවියන්ගේ පටන් අටනිකාබඹලොව දක්වා දෙව් බඹුන් සාධුකාර දුන්හ. දසදහසක්ලෝකධාතු කම්පාවිය. අප්‍රමාණ ආලෝකයක් පැතිරී ගියේය.

## බුදුරදුන් පිරිණිවූ ස්ථානය (කුසිනාරාව)

බුද්ධකාලයේදී මෙය කුඩානගරයකි. එයට පෙර මෙම නගරය කුසාවතී



ලෙෂ හැඳින්විණි.
මේ නගරයේ හිරණ්‍යවතී ගඟ අසළ පිහිටි උපවර්තන නම් මල්ල රජදරුවන්ට අයත් සල් උයනේදී පිරිනිවන් පෑසේක.
බුදු පියාණන් වහන්සේ අනුස්මරණය කිරීම පිණිෂ පස්වන සියවසේදී මහාපරිනිර්වාන විහාරය හා චෛත්‍යය 1911 දී මෙහි තිබීහීරානන්ද පණ්ඩිතුමා විසින් සොයා ගත් තඹ පතක් අනුවය.

දෙතිස්මහා පුරුෂ ලක්ෂණයන්ගෙන් අනුනව නිර්මාණය කෙරුණා මෙහි සැතැපෙන බුදුරුවේ දිග අඩි 21 කි.

# චූලෝදර - මහෝදර යුද වැදුණු මැණික් පුටුව සහ ඓතිහාසික නාගදීපය

**ශාස්ත්‍රපති, සාම විනිසුරු**
**ලොකු බණ්ඩාර මුණසිංහ**

චූලෝදර - මහෝදර යුද වැද හින්දා
සම්බුදු පියා මෙහිවිත් උන් දෑ බින්දා
සමනළ ගිරි මුදුනෙ සිරි පද තැබූ හින්දා
මගෙ සිරිලක් බිමට හැම දෙවියම වැන්දා

තෙවරක්ම සිරි පා පහස ලද ශ්‍රී ලංකාව ඈත අතීතයේ සිටම ද්වීපයක් වූ බව ඉතිහාසයේ සනිටුහන් වේ. අප තිලෝගුරු සම්බුදු පියාණන් වහන්සේ ප්‍රථම වතාවට ලක්දිව මහියංගණයටත්, දෙවනවර නාගදීපයටත්, තෙවන වර කැලණියටත් වැඩම කළ බව බෞද්ධ සාහිත්‍යයේ සඳහන් කරයි. ශ්‍රී ලංකාව ඈත අතීතයේ සිට ජනාවාස වූ කණ්ඩායම් තුනක් සිටි බව කියවේ. ඒ ජන කොට්ඨාසයන් වනුයේ දේව ගණ, නාග ගණ, යක්ෂ ගණ ලෙස දැක්වේ. නාග ගෝත්‍රික කණ්ඩායම් ගංගා, වැව්, පොකුණු ආශ්‍රිතව ජීවත් වූ අතර එම නාග ගෝත්‍රිකයට අයත් ප්‍රධානියෙකු යාපනය අර්ධ ද්වීපයේ ආසන්නව "නාග දූපත" මුල් කර ගෙන වාසය කළ බව කියවේ. විජයාවතරණයට පෙර සිට (සිංහල වංශය ආරම්භයට පෙර) මේ නාග නම් ජන කොට්ඨාසය තෙද බල පරාක්‍රමයෙන් යුතු පිරිසක් වූ අතර වූ එක නාග ප්‍රධානියකු නාග දිවයින මුල්කර ගෙන විසූ බව කියැවේ. මැණික් නාග (මණි නාග) මුහුදු නාග (සමුද්‍ර නාග) යන දෙපිරිස නාගදීපයේ ආරම්භයට හේතු සාධක විය. මෙහි විසූ නාග කණ්ඩායමට මූලිකත්වය දුන්නේ "මහෝදර" නම් නා රජු විසිනි. නාග දීපය යාපනයේ ආශ්‍රිත දූපත් කීපයකින් එකකි. ඩෙල්ෆ් දූපත, පරවි දූපත, අනලතිව් ආදී දූපත් රැසකින් යුක්ත යාපනය නාගදීපය ප්‍රධාන තැනක් ගනී. නාගදීපය වර්ග සැතපුම් පහමාරක්, හයක් තරම් වේ. එම දූපතේ ජනාවාසික පවුල් 60-70 ප්‍රමාණයක් වාසය කරති. ඔවුන්ගෙන් වැඩි දෙනෙකු ධීවර කර්මාන්තයේ යෙදෙති. මේ දූපතේ ජනතාවගේ පහසුව පිණිස ලංගම බස්රථයක්ද ධාවනය වෙයි.

එදා නාගයින්ට නායකත්වය දුන් මහෝදර නා රජුගේ නැගණිය කණ්වඩමින් නම් පර්වතයේ රාජ්‍යත්වය ඉසිලූ නා රජෙකුට සරණ පාවා දෙනු ලැබුවාය. එදා (අතීතයේ) විවාහ මංගල්‍යයේදී කාන්තාව වෙනුවෙන් දායාද දීමේ සිරිතක්ද පැවති බවක්, ඒ නිසා ඇයට ද දායාද වශයෙන් පාරම්පරිකව පැවත එන ඉතාමත් අලංකාර, මැණික් ඔබ්බ වූ මාණික්‍ය පුටුවක් ප්‍රදානය කිරීමට මහෝදර නා රජු අමතක නොකළේය. පසු කලෙක ඇයට පුතෙකු ලැබීමෙන් පසු ඔහුට "චූලෝදර" ලෙස නම් තැබීය. කාලයාගේ ඇවෑමෙන් ඇය මියගිය අතර එවිට චූලෝදරගේ මවට දායාදය ලෙසින් ලැබුණු ඉතා අගනා මාණික්‍ය පුටුවේ අයිතිය චූලෝදරට හිමි විය. ඔහුගේ මවගේ සහෝදරයා වූ මහෝදරට එයට ඉවසුම් නැතිව ගියෙන් එම මැණික් පුටුව නැවත තමා වෙත එවන ලෙස සිය බෑණා වූ චූලෝදරට දන්වා යැවීය. තම මවට දායාද ලද එම මැණික් පුටුව දැන් තමාට අයිතිය ඇති බවත්, කිසි විටකත් එය නොදෙන බව චූලෝදර දැඩි කෝපයකින් යුක්තව මාමා වූ මහෝදරට දන්වා යැවීමෙන් බෑණාගේ එම අභියෝගාත්මක ප්‍රකාශයට ප්‍රකෝප වූ මහෝදර නා රජු බෑණා සමග මහා යුද්ධයකට සැරසුණි. එදා අප සම්බුදු පියාණන් වහන්සේගේ කරුණාවට භාජනය වූයේ මේ චූලෝදර - මහෝදර (මාමා හා බෑණාගේ) අසමගියයි. බක් මස පෝදා බුදුපියාණන් වහන්සේ මොවුනට කරුණා පිණිස සෘද්ධියෙන් ලක්දිව බලා ගමන් කර නාගදීපයට වැඩම කරවීය.

ඒ යුද්ධය බුද්ධත්වයෙන් පස්වන වසරේදීය. යුද්ධයේ නිසරු බවත්, සමගියේ වටිනාකම මේ දෙපිරිසට අවබෝධ කරමින් එදා රෝහිණී ගං තෙරදී තම ඥාතීන්ට දෙසූ වට්ටක ජාතකය, ලටුකික ජාතකය, කතෝ ?ක ජාතකය යනාදී ජාතක කතාවන් ගෙනහර පාමින් පැහැදිලි කරමින් මේ දෙදෙනා අතර හටගත් යුධ වාදී අදහස් සම්පූර්ණයෙන්ම සංසිඳුවමින් සිදුවීමට ගිය මහ විපත නවතාලූ සේක.

සම්බුදු පියාණන් වහන්සේ එහිදී දෙසූ දහම ඇසූ නාග දෙපිරිස ඇතුළු පිරිස ඒ දහම් අසා පැහැදී එහි රැස්ව සිටි නාග ගෝත්‍රිකයින් සියලු දෙනාම බුදු දහම වැලඳ ගත්තේය. මෙහිදී ඒ ධර්ම ශ්‍රවණයෙන් ඉමහත් සතුටට පත් වූ චූලෝදර, මහෝදර නා රජුන් දෙදෙනා ඒ වටිනා වූ මැණික් පුටුවේ හිඳ ධර්ම දේශනා කර මැණික් පුටුව පාරිභෝගික වස්තුවක් බවට පත් කර නැවත නා රජුන්ටම පවරා දුන්හ.

නා රජුන් දෙදෙනා බුදු පියාණන් වහන්සේ වැඩ සිටි එම ස්ථානයේ මැණික් පුටුව (වට කොට) නිදන් කර "රාජායතනය" නම් වූ චෛත්‍යයක් ඉදි කළහ. එදා සිට එම භූජිය පූජනීය භූමිය බවට පත් වෙමින් එදා සිට අද දක්වා "නාගදීපය" ලෙස සුරක්ෂිතව පවතී. මේ අවස්ථාවේදී දහම් ඇසීම නාගදීපයට පැමිණ සිටි "මණි අක්ඛිත" නම් ගෝත්‍රික නායකයා බුදු සිරි පතුල ළඟ වැඳ වැටී ආරාධනාවක් කරවීය. ඒ නම් තමන්ගේ රාජධානී කොට්ඨාසයට වඩින්නැයි ඉල්ලීමක් ද කළේය. ඒ ඉල්ලීම බුදුපියාණන් වහන්සේ බාර ගන්නා බව දැන්වීමෙන් මණි අක්ඛිත නාග රාජයා ඉමහත් සතුටට පත් වී තම රාජධානිය වූ කැළණිටය පැමිණ එදා සිට බුදුපියාණන් වහන්සේ කැළණියට වැඩම වීමට මහත් කැප වීමෙන් කටයුතු කළේය. බුද්ධත්වයට පත්වී අටවන වර්ෂයේදී මහ රහතන් වහන්සේලා 500 ක් සමග කැළණියට වැඩි අවස්ථාවේදී සොළොස් මස්ථානවල සමවත් සුවෙන් මොහොතක් වැඩ විසූ බව බෞද්ධ ඉතිහාසයේ දැක්වෙයි.

# දේශයේ මුරදේවතා රාජ්‍යාරක්ෂක භික්ෂුව

මහාචාර්ය පූජ්‍ය විලේගොඩ අරියදේව හිමි
රුහුණු විශ්වවිද්‍යාලයේ පාලි හා බෞද්ධ අධ්‍යයනාංශයේ
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය

**බුදු දහමේ 'මුනි' සංකල්පයෙන් අදහස් කෙරෙන්නේ හුදකලාව වෙසෙමින් තම විමුක්තිය හෙවත් ස්වාර්ථය අරමුණ කරගෙන කටයුතු කරන කෙනෙකු පිළිබඳවයි. එබඳු කෙනෙකුට සමාජය සමඟ මුසුවීමෙන්, හෙවත් සමාජ සංසර්ගයෙන් සෙනෙහස උපදින බවත් එය සිය විමුක්තියට බාධාවන කරුණක් බවත් පෙන්වා දෙයි.**

**'සංසග්ගජාතස්ස භවන්ති සෙන්හා ස්නේහානවසං දුක්ඛ මිදං පහොතී ආදීනවං සෙනහජං පෙක්ඛමානො එකෝ චරෝ ඛග්ග විසානකපේපා'**

(සුත්ත නිපාත. 36)



මෙහි'මුනි' යන්නෙන් කියැවෙන්නේ අප කල්පනා කරන බාහිර නිශ්ශබ්දතාව ම නොවේ. 'නතෙන මුනිනෝ හෝති' පිටතින් පෙනෙන නිහඬ බවට වඩා ඇතුළත ඇති නිහඬබවක් 'මුනි'යන වචනයෙන් අර්ථ දැක්වේ.

අපරදිග ඇතැම් විචාරකයෝ බුදුදහම මිනිසාගේ සමාජගත බැඳීම් ප්‍රතික්ෂේප කරන දහමක් ලෙස අර්ථකථන දක්වති, මාගන්ධි සූත්‍රයෙහි දැක්වෙන මුනිවරයකුගේ පද්මාකාර ජීවිතයෙන් අදහස්වන්නේ සමාජයෙහි ජීවත්වුවත් සමාජය සමඟ ඇලීමක් බැඳීමක් නැතිව, සමාජය සුවඳවත් කරන සමාජ යහපත සඳහා ක්‍රියාකරන චරිතයක් වශයෙනි.

එසේ නැතිව සමාජයෙන් පැන දුවන හුදකලා වූ කෙනෙකු නොවේ. මුනිවරයා සතු උදාරතර අරමුණක් ඇති අතර එය සාක්ෂාත් කර ගැනීමටත් සාක්ෂාත් කරගත් පසු, ඔහු පිපී සුවඳ හමන මලක් සේ ලෝකයාගේ ගුණ සුවඳ විහිදුවීමට කටයුතු කරන කෙනෙක් බවයි, මෙයින් අදහස් කරන්නේ, ඒ අනුව මුනිවරයා ලෝකයෙන් පලා නොගොස් ලෝකයෙහිම වෙසෙමින්, ලෝකයේ විෂමතාවන් හා නොගැටී නොඇලී ජීවත්වන කෙනෙකි.

භික්ෂුවකගේ සමාජ සම්බන්ධතාව කෙසේ විය යුතුද යන්න උපමා දෙකකින් පෙන්වා දී ඇත. 'ජරූදපාන' හා 'චන්දූපමා' යනු ඒ උපමා දෙකයි. ජරුදපාන යනු පාළු ළිඳ යන්නයි. චන්දූපමා යනු "සඳේ"උපමාවයි. භික්ෂුව ගිහි සමාජය කෙරෙහි දැක්විය යුත්තේ කෙබඳු සම්බන්ධයක්ද, යන්න මෙමඟින් හඟවයි. පාළු ළිඳකට කෙනෙක් එබී බලන්නේ සිත හා කය දෙකම ළිඳෙන් මෑත් කරගෙනයි. ළිඳ ඇතුලට කය වඩාත් නැඹුරු වුවහොත් ළිඳට වැටේවි යන බියක් එබී බලන තැනැත්තාට නිතැනින් ඇතිවේ. ඒ බිය නිසාම සිත කය දෙකම ළිඳෙන් මැත් කර ළිඳ දිහා බලයි.

මෙලෙසින් භික්ෂුව ගිහි සමාජය කෙරෙහි හැසිරිය යුත්තේත් ඕනෑවට වඩා කුල ගෙවල් ඇසුරු කිරීමෙන් එහි ඇල්මක් ඇතිවී පැවැදි බවෙන් ගිලිහීමටද යළි ඉඩක් ලැබෙන බැවිනි. දෙවන උපමාව මඟින් භික්ෂුවක් සමාජයෙන් බැහැරව සිටින කෙනෙක් සේ පෙනි ගියත් උන්වහන්සේ සමාජයට ආලෝකය සපයන සමාජයේ ඉහළ තලයක සිට එකී සමාජයේ පුද්ගලයන් කෙරෙහි ජාති, කුලමල ගෝත්‍ර, උස් මිටිකම්, කිසිවක් නොසලකන කෙනෙකු බව මනාව පෙන්වා දෙයි. සඳ ලෝකයට ආලෝකය ගෙනෙන්නේ ලෝක විෂමතාවක් කෙරෙහි සැලකිලි දක්වමින් නොවේ. භික්ෂුවට 'චන්දූපමා'ව උචිත වන්නේ මේ අයුරිනි.

# බෞද්ධාලෝකය

සම්බුද්ධ ශාසනය ශ්‍රී ලංකාද්වීපයට හඳුන්වා දුන් තැන් පටන් වර්තමානය දක්වා වසර දෙදහස් හාරසියයක් ඉතිහාසයෙහි භික්ෂුවකගේ මෙම ආකල්පයන් හා භික්ෂු සාරූප්‍යය ආරක්ෂා වී තිබීම බෞද්ධ ලෝකයේ මහත් භාග්‍යයකි. ඕනෑම සමාජ සංස්ථාවක් කාලයාගේ ඇවෑමෙන් විකාශනය වී අභාවයට යනු ඇත.

**ලාංකීය ථෙරවාදී භික්ෂු සමාජයද මේසා දීර්ඝ කාලයක් තුළ විවිධ හැල හැප්පිලි ඔස්සේ උච්චාවච තත්ත්වයන්ට මුහුණ දුන් අතර වර්තමානය දක්වා අඛණ්ඩව පැවැත්ම සැබැවින්ම අසිරිමත් සිදුවීමකි. එක අතකින් මේ දිවයිනෙහි බුදු දහම දායාද කොට දුන් එහි උත්පත්තිය සිදුවූ භාරතයෙන් වෙන් වී තිබීම නිසා ලාංකීය බුදුදහමේ අනන්‍යතාවය ආරක්ෂා වූ බවට සිතිය හැක. එපමණක් නොව මුල් බුදු දහමේ ඓතිහාසික ස්වරූපය ද රැක ගැනීමට ලාංකීය භික්ෂූහු පොහොසත් වූහ.**

**ලංකාව තුළ බුදු දහම ස්ථාපිත වූයේ මෙහි පැවති පරිසරයට අනුවර්තනය වීමෙනි. බුදු දහම ජාතික ආගම බවට පත්වීම හා පාලකයා බෞද්ධයකුවීම අනිවාර්යය විය. භික්ෂුව දේශයේ මුරදේවතාව ලෙසත් රාජ්‍යයේ ආරක්ෂකයා ලෙසත් ජනතාව විසින් පිලිගැනුනි. ඒ කවර වගකීමක් භික්ෂුව වෙත පැවරුණත් භික්ෂුවගේ අනන්‍යතාව එම ශාසනයේ අරමුණු සමඟ සුරක්ෂිත කර ගැනීමට ලාංකීය භික්ෂුව සමත් විය.**

'අඤ්ඤාමෙ ආකප්පො කරණීයොති පබ්බජිතෙන අභිනහං පච්චවෙක්ඛිතබ්බං'

ගිහියාට අනුශාසනා කරන ගිහියන්ගෙන් යැපෙන භික්ෂුව තමා පෝෂණය කරන ඔවුන් කෙරෙහි කෘතවේදී වන්නේ ධර්ම මාර්ගය කියාදීමෙන් මිස ඔහුගේ ලෞකික කුදුමහත් කටයුතු සපුරාලන්නකු වශයෙන් නොවේ. භික්ෂුවකගේ බලය රඳා පවත්නේ මේ ගිහි සීමාව මැනවින් තේරුම්ගෙන ලෞකික වූ 'පාළු ළිඳට' නොවැටී 'සඳක්' සේ ඉහලින් ආලෝකය ගෙනස දෙන කෙනෙක් වුවහොත් පමණි. එසේ නොවී තම සීමාවෙන් පිටතට ගිය සෑමවිටම භික්ෂුව පරිහානියට පත්විය. ඒ සමඟම සම්බුද්ධ ශාසනයේ බිඳ වැටීම ද සිදුවිය.

භික්ෂුව ජාතියේ මුරදේවතාව හෝ රාජ්‍ය ආරක්ෂකයා මිස කිසිකලෙකත් පාලකයාගේ භූමිකාව නොගත්තේය. එහෙත් පසුගිය මෑත වකවානුව තුළ භික්ෂුව තම සීමාව ඉක්මවා පාලකයකු බවටත් නායකයකු බවටත් පත්වීමට උත්සාහ ගත් බව පෙනේ. එමඟින් කිසියම් ශාසනික පරිහානයක් ද සනිටුහන් කර ඇති බව පැහැදිලි වේ. එහෙත් ඉතිහාසය එය කෙතෙක් දුරට පිළිගනීවි ද? නැති ද? යන්න තීරණය කරනු ඇත.

යුරෝපීය දේශපාලන චින්තනයේ ඉතා වැදගත් මූලාශ්‍රයක් වන්නේ ශුද්ධ වූ බයිබල යයි. ක්‍රිස්තු ධර්මයේත් එය බිහිකළ නිර්මාතෘවරයාගේ ත් ඉතිහාසය අනුව රෝම ආණ්ඩුවත් ක්‍රිස්තියානි පූජක පංතියත් අතර පැවතුනේ බල අරගලයකි. "සීසර්ගේ දෙය සීසර්ට දීපල්ලා දෙවියන්ගේ දෙය දෙවියන්ට දීපල්ලා".

(ශුද්ධ බයිබලය - ශුද්ධ වූ මාර්ක් 12 කොටස පිටුව 73)

මෙම ප්‍රකාශය පදනම් කරගනිමින් පසු කාලයේ දී එනම් මධ්‍යතන යුගයෙහි යුරෝපයේ පල්ලියත්, ක්‍රිස්තියානි රාජ්‍යයත් අතර යුද්ධ කෝළාහල රැසක් පැන නැගුණි. බෞද්ධ ඉතිහාසය අනුව බුදුන් වහන්සේගේ ශ්‍රාවක සංඝයා හා රාජ්‍ය අතර එබඳු ගැටුම් හටගන්නේ නැත. ඉහත ප්‍රකාශයෙන් කියැවෙන්නේ ලෞකික අංශය පාලනය කිරීම රාජ්‍යයක වගකීම වන අතර රටේ ජනතාවගේ අධ්‍යාත්මික අංශය පාලනයේ වගකීම පල්ලියට ලැබිය යුතු බවත් ය. බුදුරජුන් පහළවන සමහෙයි බ්‍රාහ්මණ සමාජය දැරුවේ මෙම අදහස බව මැක්ස්වේබර් පෙන්වා දෙන අතර බෞද්ධ සමාජය තුළ දිව්‍යමය අධිකාරියක් කිසි කලෙස බිහි නොවූ නිසා රාජ්‍ය පාලනය හා භික්ෂුව අතර එබඳු ගැටුමක් කිසිදා ඇති නොවූ බව දක්වය. (ඒං ඇඉැරල ˜දජස්කදටහ දෙ සෘැකසටසදබග වග 30)

දේශයේ මුරදේවතාවා ලෙස ඉතිහාසය තුළ භික්ෂුවව පිළිබඳ සොයා බැලීමේ දී අපගේ අවධානය වඩාත් යොමුවන්නේ ලාංකීය භික්ෂුව පරපුර පිළිබඳව යි. භාරතය තුළත් ලාංකීය භූමිය තුළත් රාජ අනුග්‍රහය නොලැබූ හැමවිටම සම්බුද්ධ ශාසනය පරිහානියට පත්විය. එය බුදු දහම බිහිවූ දවස පටන් වර්තමානය දක්වා ම පරීක්ෂාකර බලන්නකුට පැහැදිලිවන සත්‍යයකි. මෙහිදී දේශපාලනයත් බුදුදහමත් පෑහී-නොපෑහී බොහෝ පරිසරයන් යෙදුනු ගමනක් යෙදුනු බවද ඉන් පැහැදිලි වේ.

භික්ෂුව තම ශාසනික භූමිකාවෙන් පිට පැන්න අවස්ථාවන්හිදී ධර්ම විනය නායකත්වයේ තබා ක්‍රියාකල ශාසන භාරධාරී භික්ෂූන්ගේ මග පෙන්වාදීම් මගින් පාලකයන්ගේ අනුග්‍රහයෙන් එය නිදොස් කොට සංඝයා නියම මාර්ගයෙහි පිහිට වූ බවද අප තේරුම්ගත යුතුය. රාජ්‍ය පාලකයාගේ අවශ්‍යතාවන්ට යටවී ලාභ සත්කාරවලට යටවූ භික්ෂූන් නිසා ශාසනික අර්බුද ඇති වූ බවද ලාංකීය භික්ෂු ඉතිහාසය පුරා දැකගත හැක.

එවැනි අවස්ථාවන් ද නිවැරදි කරගැනීමට හැකිවූයේ භික්ෂුව හා පාලකයාගේ අවංක මැදිහත්වීම නිසාය. සම්බුද්ධ ශාසනයේ ආරක්ෂකයා ජාතියේ මුරදේවතාව යන භික්ෂුවගේ භූමිකාව සැබෑ ලෙස අර්ථවත් වූයේ භික්ෂුව ස්වකීය අනන්‍යතාවද රැකගනිමින් පොදු ජන යහපත සඳහා ක්‍රියාකිරීම නිසා බව පුන පුනා කිවයුතු නැත.

කිසියම් රටක අධාර්මික පාලනයක් ගෙනයාමෙන් රටේ ආර්ථික සංවර්ධනය බිඳ වැටීම නිසා රට හැම අතින්ම පරිහානියට වැටෙන බව, භික්ෂූන විසින් රජුට නිතර අවධාරණ කරන ලදි. පරසතුරු ආක්‍රමණවලට හසුවීමටද එය ප්‍රධාන හේතුව විය. බුදුන් වහන්සේත් මෙරටට බුදු දහම හඳුන්වා දුන් මිහිඳු මහරහතන් වහන්සේත් රජවරුන්ට පැහැදිලි කර දුන්නේ මෙම සත්‍යයයි.

භික්ෂුව රටදැය සමයේ ආරක්ෂකයා මිස පාලකයා නොවීය. තමන්ට රාජ්‍ය බලය ඉල්ලා අරගලය කිරීම මෑතක් වනතුරු ම භික්ෂුවට අවශ්‍ය නොවීය. මක්නිසාද ? යත් භික්ෂුවගේ ඒකායන පරමාර්ථය නිවන් පසක් කරගැනීම වන නිසාය. එතෙක් මෙලොවදි තමාව සිවුපසයෙන් පෝෂණය කරන ගිහි ජනතාවට දැහැමි පරිසරයක් සඳහා අවශ්‍ය උපදේශයන් ලබාදීමට උන්වහන්සේ නොපැකිලිව කටයුතු කළහ. මිහිඳු මාහිමියන් විසින් දේශනාකළ ප්‍රධාන සූත්‍රය වූ හත්ථිපදොම සූත්‍රය අද වඩාත් ප්‍රකටව අප දන්නා නමුත් උන්වහන්සේ රජුට දෙසූ රාජෝවාද ජාතකය (ජාතකට්ඨ කථා 77, 78) අප්පමාද සූත්‍රය (සං. 3.13) අප බොහෝවිට අමතක කොට ඇතැයි සිතේ. රාජ්‍ය පාලකයාගේ අධාර්මික පාලනය නිසා "ගිතෙල් මී පැණි ආදිය ද වන මුල් එල ද අමිහිරි වේ. ඕජස් රහිත වේ. මෙපමණක් නොව මුලු රටම ඔද රහිත වේ. කසට වේ. රජුන් දැහැමි වන කල වනමුල් එල මිහිරි වේ."

"ගව රැලේ නායක ගවයා ගඟකින් තරණය කරනවිට උං ඇදට තරණය කරයි නම් සෙසු ගවයෝද එසේම ඇදට තරණ කරති". නායක "ගවයා සෘජුව තරණය කරන විට සෙසු ගවයෝ ද සෘජුව තරණය කෙරෙති". රාජ්‍ය නායකයා ධර්මයේ හැසිරේ. රජු ඡන්ද, දෝස, මෝහ, භය යන සතර අගතියට ගියේ නම් ප්‍රජාවද එසේ අධර්මයට නැමෙති.

රජු දැහැම්වන කල්හි මුළු රටම දැහැමි වේ.

සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ ජාතික සමාජසේවා මණ්ඩලය මගින් පාලනය වනු ලබන ජ්‍යෙෂ්ඨ පුරවැසි නිවාස හා භික්ෂු ගිලන් විවේකාශ්‍රම සඳහා ඔබගේ පරිත්‍යාගයන් ලබා දීමට අපව අමතන්න.

පරිපාලන නඩත්තු, සනීපාරක්ෂක සහ වෙනත් අවශ්‍යතා සඳහා ඔබට පරිත්‍යාගයන් ලබා දිය හැක.

දුරකතන අංක :- 011-2691695/2688517
සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය,
අංක 380, බෞද්ධාලෝක මාවත, කොළඹ 07.

ජාතික සමාජසේවා මණ්ඩලය - සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය
ගිණුම් අංකය :- 078-100193691803
මහජන බැංකුව බොරැල්ල ශාඛාව

# ආර්ය ධර්මය යනු කවරේද?

බුදුහු ධර්මය, ආර්ය ධර්මය, අනවද්‍ය ධර්මය, අපචයගාමී ධර්මය, ගුත්ල ධර්මය, සද් ධර්මය, සත් පුරුෂ ධර්මය, ආර්ය මාර්ගය, මධ්‍යම ප්‍රතිපදාව, ධර්ම විනය, සුගත විනය යනාදී නම් රාශියකින් සූත්‍රාගත දේශනා තුළ ස්වීය ඉගැන්වීම හඳුන්වා දෙති. බුදුන් විසින්ද බුදුන්ගේ සමකාලීන ප්‍රකට ශ්‍රාවකයන් විසින්ද මෙකී නම් යටතේ හඳුන්වා දී ඇති බුදු දහම යනුවෙන් විනිශ්චය කළ හැකි ඉගැන්වීම් කිහිපයක් නිදර්ශන වශයෙන් මෙහිලා පළමුව සඳහන් කිරීම යෝග්‍යයි. අංගුත්තර නිකායේ අරිය මග්ග වග්ගයෙහි බුදුහු මෙසේ දේශනා කරති.

මහණෙනි, ආර්ය ධර්මය යනු කවරේද?

ප්‍රාණ ඝාතයෙන් වැළකීම, සොරකමින් වැළකීම, කාමය වරදවා හැසිරීමෙන් වැළකීම, බොරු කීමෙන් වැළකීම, කේළාම් කීමෙන් වැළකීම, පරුෂ වචනයෙන් වැළකීම, නොගැඹුරු වචනයෙන් වැළකීම, දැඩි ලෝභයෙන් වැළකීම, ද්වේෂයෙන් වැළකීම, නිවැරදි දැකීම යන ගුණාංග ප්‍රගුණ කිරීම ආර්ය ධර්මය වේ. මෙහි අග සඳහන් නිවැරදි දැකීම පිළිබඳ විවරණයක යෙදෙන සැරියුත් හිමියෝ මජ්ඣිම නිකායේ සම්මා දිට්ඨි සූත්‍රයේදී එම නිවැරදි දැකීම, කර්මය, ආහාරය, සත්‍යය, ජරා මරණය, ජාතිය, භවය, උපාදානය, තෘෂ්ණාව, වේදනාව, ස්පර්ශය, ෂඩ් ආයතනය, නාම රූපය, විඥානය, සංස්කාරය, අවිද්‍යාව, ආශ්‍රව යන කරුණු සොළස පිළිබඳ අවිපරිත අවබෝධය වශයෙන් හඳුන්වති.

බුදුන්ගේ අනුමැතිය ඇතිව පුහුණු වන්නන්ගේ ප්‍රයෝජනය සඳහා වූ ප්‍රතිපදාවක් ඉදිරිපත් කළ ආනන්ද හිමියෝ මජ්ඣිම නිකායේ සොබ සූත්‍රයේදී ප්‍රගුණ කටයුතු ගුණාංග කිහිපයක් ඉදිරිපත් කරති. සිල්වත්කම, දැමුණු ඉන්ද්‍රියයන් ඇති බව, භෝජනයෙහි පමණ දැනීම, අවදිකම, සද්ධර්ම සතකින් සමන්විත බව හා දැහැන් සුවය පහසුවෙන් ලබාගත හැකි බව යන ගුණාංග සයක් නම් කරන ආනන්ද හිමියන් සප්ත සද්ධර්මය මෙසේ විවරණය කරති.

1. ශ්‍රද්ධාව යනු තථාගතයන්ගේ බෝධිය පිළිබඳ විශ්වාසය තැබීමයි. අරහාදී නව බුදුගුණ විශ්වාස කිරීම මෙයින් අපේක්ෂා කෙරේ.

2. හිරි යනු සිත, කය, වචනය යන තුන්දොරින් පළවන දුශ්චරිතයන්ගේ ආදීනව පිළිබඳ අවදිකමයි. පව් කිරීම සම්බන්ධයෙන් වැළකීමේ ඇති අනුහස් අවබෝධය මෙයින් අපේක්ෂා කෙරේ.

3. ඔතප් යනු ඉහත සඳහන් දුශ්චරිතවල නියුතු වීම අයෝග්‍ය බව වටහා ගැනීමයි. විචාර පූර්වක ලෙස හොඳ නොහොඳ, පිරිසිදු දැනීම මෙයින් අපේක්ෂා කෙරේ.

4. බහු ශ්‍රැතිය යනු උතුම් හැසිරීම කවරේදැයි පැහැදිලි කොට දක්වන බුද්ධාදීන්ගේ දේශනා මනා කොට අසා ඇති බවයි.


5. වීර්යය යනු අකුලසින් වැළකීමටද, කුසල් ප්‍රගුණ කිරීමටද කරනු ලබන උත්සාහයයි.

6. සමෘතිය යනු වික්ෂිප්ත බවෙන් තොරවූ අවදිකමයි. එළඹ සිටි සිහියයි.

7. ප්‍රඥාව යන සියලු දුක් සිඳින මාර්ගය භාවනාමය වශයෙන් ප්‍රගුණ කිරීම පිණිස ධර්මයන්ගේ ඉපදීම හා හැඟීම යථාර්ථයෙන් දැන අවබෝධ කරගැනීමයි.

## 2021 මැයි මස 26 වන දින බෞද්ධාලෝක මාවතේ වෙසක් උත්සවය නිමිත්තෙන් පැවති ආලෝක පූජාව ගරු අමාත්‍ය රියර් අද්මිරාල් සරත් වීරසේකර මැතිතුමාගේ සහභාගීත්වයෙන්





**2021 මැයි මස 24 වන දින රටට සහ සියළු ලෝවාසීන්ට සෙත් පතා පිරිත් පිංකමක් සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලන මූලස්ථානයේ පවත්වන ලදි.**















# පූජාවලි 2021

## සමස්ත ලංකා බෞද්ධ චිත්‍ර හා ගීත රචනා තරඟාවලිය

සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ, ජාතික අධ්‍යාපන මණ්ඩලය මඟින් සංවිධානය කරනු ලබන පහත සඳහන් චිත්‍ර සහ ගීත රචනා තරග සඳහා නිර්මාණ **2021 ජුලි 20 සිට අගෝස්තු 31** වන දින දක්වා භාර ගැනේ.

### සමස්ත ලංකා බෞද්ධ චිත්‍ර තරඟය

දිවයිනේ සියලුම පාසල් සහ විශ්වවිද්‍යාල සිසුන් ගේ බෞද්ධ චිත්‍ර නිර්මාණ මෙම අංශය යටතේ ඉදිරිපත් කල හැකිවේ.

පූර්ව ප්‍රාථමික අංශය අවු. 05 - 08
ප්‍රාථමික අංශය අවු. 09 - අවු. 11
කනිෂ්ඨ අංශය අවු. 12 - අවු. 14
ජ්‍යෙෂ්ඨ අංශය අවු. 15 - අවු. 18
විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන අංශය අභ්‍යන්තර ශිෂ්‍ය ලියාපදිංචිය

### සමස්ත ලංකා ළමා සංවර්ධන බෞද්ධ චිත්‍ර තරඟය

දිවයිනේ පවතින රජයේ සහ පෞද්ගලික ළමා සංවර්ධන මධ්‍යස්ථාන සහ සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ ළමා සංවර්ධන මධ්‍යස්ථානයන්හි සිසුන් සඳහා වෙන්වූ බෞද්ධ චිත්‍ර තරගයයි.

(ළ/ස) පූර්ව ප්‍රාථමික අංශය - අවු. 5, 8
(ළ/ස) ප්‍රාථමික අංශය - අවු. 9, 11
(ළ/ස) කනිෂ්ඨ අංශය - අවු. 12, 14
(ළ/ස) ජ්‍යෙෂ්ඨ අංශය - අවු. 15 සිට

### සමස්ත ලංකා පාරිවේණික හා විද්‍යායතන බෞද්ධ චිත්‍ර තරඟය

දිවයිනේ සයිලුම පාරිවේණික හා විද්‍යායතන සිසුන්ගේ චිත්‍ර නිර්මාණ මෙම අංශය යටතේ ඉදිරිපත් කල හැකිවේ.

පා/පූර්ව ප්‍රථමික අංශය - මූලික 1 විද්‍යායතන 6,7
පා/ප්‍රාථමික අංශය - 2, 3 ශ්‍රේණි. විද්‍යායතන 8,9
පා/කනිශ්ඨ අංශය - 4, 5 ශ්‍රේණි. විද්‍යායතන 10,11
පා/ජ්‍යෙෂ්ඨ අංශය - ප්‍රාචීන/ප්‍රාරම්භ/මධ්‍යම/අවසාන 12, 13 ශ්‍රේණි

### සමස්ත ලංකා පරිගණක බෞද්ධ චිත්‍ර තරඟය විවෘත තරග අංශයකි

පරිගණක බෞද්ධ චිත්‍ර තරඟය - වයස අවු. 18 අඩු සිසු දරු දැරියන්ගේ පරිගණක චිත්‍ර මේ සඳහා ඉදිරිපත් කල හැකිවේ.

පරිගණක බෞද්ධ චිත්‍ර තරඟය (විවෘත) - අවු. 19 ට වැඩි ඕනෑම පුරවැසියෙකුට මෙම තරග අංශයට නිර්මාණ ඉදිරිපත් කල හැකවේ

### චිත්‍ර නිර්මාණය කල යුතු තේමා

1. පූර්ව ප්‍රාථමික සහ ප්‍රාථමික අංශ - බුදු දහමට අදාල තේමාවක් යටතේ සුදුසු මාතෘකාවක් තෝරා ගැනීම
2. කනිෂ්ඨ අංශය - අටලෝ දහම
3. ජ්‍යෙෂ්ඨ අංශය - මනුෂ්‍යත්වයේ වටිනාකම
4. විශ්වවිද්‍යාල, උසස් අධ්‍යාපන සහ විවෘත - සාර්ථක දිවියකට බුදු දහම

### චිත්‍ර ඇඳීමේ කඩදාසි ප්‍රමාණයන්

1. පූර්ව ප්‍රාථමික, ප්‍රාථමික, කනිෂ්ඨ සහ ජ්‍යෙෂ්ඨ තරග අංශ සඳහා - අඟල් 14 × 18 ප්‍රමාණය
2. විශ්වවිද්‍යාල සහ විවෘත අංශ - අඟල් 16 × 20 ප්‍රමාණය
3. පරිගණක චිත්‍ර අංශය - 3 ප්‍රමාණය

## සමස්ත ලංකා බෞද්ධ ගීත රචනා තරඟාවලිය

### සමස්ත ලංකා බෞද්ධ ගීත රචනා තරඟය

1. ශිෂ්‍ය අංශය - වයස අවු. 18 ට අඩු සියලුම දරු දැරියන්ට මෙම අංශය සඳහා බෞද්ධ ගීත රචනා ඉදිරිපත් කල හැකිවේ.
2. විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන අංශය - විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතන විද්‍යාර්තීන්ගේ ගීත රචනා මෙම අංශයට ඉදිරිපත් කල හැකිවේ.
3. විවෘත අංශය - ඉහත අංක 1,2 යටතේ ඇතුලත් නොවන ඕනෑම ක්ෂෙත්‍රයක පුද්ගලයෙකුට මෙම තරග අංශය සඳහා ගීත රචනා ඉදිරිපත් කළ හැකිවේ.

### සමස්ත ලංකා බෞද්ධ ළමා ගීත රචනා තරඟය

1. ශිෂ්‍ය අංශය - වයස අවු. 18 ට අඩු සියලුම දරු දැරියන්ට මෙම අංශය සඳහා බෞද්ධ ගීත රචනා ඉදිරිපත් කල හැකිවේ.
2. විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන අංශය - විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතන විද්‍යාර්තීන්ගේ ගීත රචනා මෙම අංශය සඳහා ඉදිරිපත් කළ හැකිවේ.
3. විවෘත අංශය - ඉහත අංක 1,2 යටතේ ඇතුලත් නොවන ඕනෑම පුද්ගලයෙකුට මෙම තරග අංශය සඳහා ගීත රචනා ඉදිරිපත් කළ හැකිවේ.

### බෞද්ධ ගීත සහ බෞද්ධ ළමා ගීත රචනා සඳහා තේමාවන් තෝරා ගැනීම

★ තමන් කැමති බෞද්ධ තේමාවක් හෝ සංකල්පයක් යටතේ බෞද්ධ ගීත රචනාවක් නිර්මාණය කිරීම.

**සියලුම බෞද්ධ චිත්‍ර තරග සහ බෞද්ධ ගීත රචනා සඳහා අයදුම් පත්‍ර සහ විස්තර කොළඹ 07, අංක 380, බෞද්ධාලෝක මාවත, සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ මූලස්ථාන කාර්යාලයෙන් හෝ අපගේ වෙබ් අඩවිය www.acbc.lk/docs වෙත යොමුවීමෙන් ලබා ගත හැක.**

**දුරකතනයෙන් විමසීම් - 0765 611 374 - 0772 342 577 - 0714 894 925**

* සියලුම තරග අංශයන්හි ප්‍රථම, දෙවන, තෙවන ස්ථාන සඳහා ත්‍යාග සහ සහතික පත්‍ර ද, විශිෂ්ඨ කුසලතා, කුසලතා සහිත නිර්මාණ වෙනුවෙන් සහතික පත්‍ර ද, සුදුසු කෘති සඳහා සහභාගීත්ව සහතික ද පිරිනමනු ලැබේ.

**ජාතික අධ්‍යාපන මණ්ඩලය,සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය**

අංක. 380, බෞද්ධාලෝක මාවත, කොළඹ 07. - දු.ක. 0112 691 695/www.acbc.lk/docs